# වාර්ෂික වාර්තාව -2021
# ஆண்டறிக்கை -2021
# Annual Report -2021

## හෝමියෝපති වෛද්‍ය සභාව
## ஹோமியோபதி மருத்துவ சபை
## Homoeopathic Medical Council

දේශීය වෛදකම් ප්‍රවර්ධන,ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

சுதேச வைத்திய முறைகள் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூகச் சுகாதார இராஜாங்க அமைச்சு

**State Ministry of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health**

# පටුන

පිටුව


| | |
|---|---|
| 1. සාරාංශය | 02 |
| 2. හැඳින්වීම | 03 |
| 3. හෝමියෝපති වෛද්‍ය සභාව | 04 |
| 4. පසුබිම් විස්තරය | 05 |
| 5. වෛද්‍ය සභාවේ අරමුණු | 07 |
| 6. වෛද්‍ය සභාව සතු බලතල | 08 |
| 7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 10 |
| 8. සංස්ථාපිත තොරතුරු | 11 |
| 9. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 12 |
| 10. වාර්ෂික ගිණුම් වාර්තා | 22 |
| 11. විගණන වාර්තාව | |
| 12. සුභාසිංශන | |

# 01. සාරාංශය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම යන දැක්මෙන් යුක්තව හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම යන මෙහෙවර ඉටු කිරීමයි.

2021 වසර ආරම්භ වූයේ නව හෝමියෝපති වෛද්‍ය සභාවක් පත් කෙරී ඇති තත්ත්වයක සිටය. 2016 අංක 10 දරණ හෝමියෝපති පනත ප්‍රකාරව දෙවන වෛද්‍ය සභාව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය ගරු රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා විසින් 2020.09.09 දින පත් කරනු ලැබූ අතර ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන්ගේ ඡන්දයෙන් තෝරා ගන්නා ලද හෝමියෝපති වෛද්‍යවරුන් 05 දෙනෙකු ද නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකු ද සහ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුළත් සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත මෙම වෛද්‍ය සභාව 2023.09.08 දින සිට වසර 03ක කාලයක් සඳහා මෙලෙස පත් කරන ලදී.

2021 වසර ද යථා පරිදි හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මනා කළමනාකරණයක් යටතේ පවත්වාගෙන යාමට හැකි වූ වසරක් නොවීය. 2021.05.22 දින සිට 2021.06.17 දක්වා කොවිඩ් වසංගතය හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය වසා තැබීමත් වසර අවසානය දක්වාම මෙම දිස්ත්‍රික්කයේ පොදු ප්‍රවාහනය ඇතුලු විවිධ සේවාවන්ගේ සිදු කෙරුණු සීමා කිරීම් වෛද්‍ය සභා කාර්යාලයේ කටයුතු අඩපන වීමට විශේෂයෙන්ම හේතු විය. දැඩි කාර්ය මණ්ඩල හිඟයක් යටතේ අසීරුවෙන් පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සභා කාර්යාල කාර්ය මණ්ඩලයේ පැමිණීමද සීමා වූ තත්ත්වයක් නිර්මාණය වීම අපේක්ෂිත කාර්ය සාධනයන් කරා ළඟා වීමට උත්සාහ දැරීමට පවා අසීරු තත්ත්වයක් උදා කළේ ය. එනමුත්, වසර අග භාගයේ හෝමියෝපති පාසල් ගොඩනැගිල්ල කාර්යාල ගොඩනැගිල්ලක් දක්වා සංවර්ධනය කිරීම වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දී තිබූ අතර ඔවුන් එම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර තිබුණි.

# 02. හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය සුවපත් කිරීම ” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වන විට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. මේ වන විට ලොව පුරා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, ලොව පුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන ද බිහි කරමින් පවතින බව සඳහන් කළ යුතුය.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මඟින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාර ධූර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැගී නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස ගැනිය හැකි හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්ය භාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 13 ක රජයේ හෝමියෝපති සායන 13 ක් ස්ථාපිත කර තිබුණි. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුණෙෙ, මාතලේ, කුරුණෑගල, තෝලංගමුව, පුත්තලම, කොත්මලේ, මඩකලපුව, අම්බලන්තොට, ඉංගිරිය, හා ගාල්ල මෙසේ වෛද්‍ය සභාව මඟින් රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යනු ලැබූ ස්ථාන විය.

2021 වසරේදී වෛද්‍ය සභාව විසින් මෙහෙයවන රජයේ හෝමියෝපති සායන තවත් දිස්ත්‍රික්ක 01ක එක් සායනයක් පමණක් ස්ථාපිත කිරීමට හැකි විය. ඒ අනුව මෙතෙක් 12ක්ව පැවති රජයේ හෝමියෝපති සායන සංඛ්‍යාව 13ක් දක්වා වර්ධනය කිරීමට හැකි විය. ඒ අනුව කාර්ය මණ්ඩලයටද නව තනතුරු 03කට බඳවා ගැනීමට හැකි විය.

# 03. හෝමියෝපති වෛද්‍ය සභාව

## දැක්ම

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම"

## මෙහෙවර

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරහයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම."

## පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධානවලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

# 04. නෛතික පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. නව වෛද්‍ය සභාව **හෝමියෝපති වෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් නම් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

## නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

## 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග

1. හෝමියෝපති රෙගුලාසි - 1980

   (වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම.

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්, තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජූලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. මෙම අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018 ඔක්තොම්බර් 19 දිනෙන් අවසන් විය. 2016 අංක 10 දරණ හෝමියෝපති පනත ප්‍රකාරව එහි නිල කාලය වසර තුනකි. 2020.09.09 දින සිට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමත්‍ය ගරු නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමා විසින් හෝමියෝපති වෛද්‍ය සභාව පත් කරන ලදී. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකුණි.

# 05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම.

2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.

3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම.

4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම.

5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම.

6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

# 06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම.

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම.

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම.

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම.

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම.

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය.

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම.

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මුල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම.

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම.

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම.

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම.

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම.

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම.

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

# 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධූර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ඡන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම්/ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

# 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **ආයතනයේ නම** | :- | හෝමියෝපති වෛද්‍ය සභාව |
| **ලිපිනය** | :- | අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,<br>වැලිසර,<br>රාගම. |
| **දුරකතන අංකය** | :- | 011-2958175 |
| **ෆැක්ස්** | :- | 011-2958175 |
| **විද්‍යුත් තැපැල** | | homosri.mcouncil@gmail.com |
| **සංස්ථාපිත ආයතනයේ තත්ත්වය** | :- | 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත. |
| **පරිපාලන ව්‍යුහය** | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| **බැංකුකරුවෝ** | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල |

# 09. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය

2021 වසර ද ආරම්භ වූයේ නව හෝමියෝපති වෛද්‍ය සභාවක් පත් කෙරී ඇති තත්ත්වයක සිටය. 2016 අංක 10 දරණ හෝමියෝපති පනත ප්‍රකාරව දෙවන වෛද්‍ය සභාව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය ගරු රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා විසින් 2020.09.09 දින පත් කරනු ලැබූ අතර ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන්ගේ ඡන්දයෙන් තෝරා ගන්නා ලද හෝමියෝපති වෛද්‍යවරුන් 05 දෙනෙකු ද නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකු ද සහ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුළත් සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත මෙම වෛද්‍ය සභාව 2023 දක්වා වසර 03ක කාලයක් සඳහා මෙලෙස පත් කර තිබූ අතර ගිය වසරේ හෝමියෝපති වෛද්‍ය සභාවේ සිදු වූ වැදගත්ම කාර්ය වූයේ අභිනව වෛද්‍ය සභාව පත් කිරීම වේ.

2021 වසර ද යථා පරිදි හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මනා කළමණාකරණයක් යටතේ පවත්වාගෙන යාමට හැකි වූ වසරක් නොවී ය. 2021.05.22 දින සිට 2021.06.17 දක්වා කොවිඩ් වසංගතය හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය වසා තැබීමත් වසර අවසානය දක්වාම මෙම දිස්ත්‍රික්කයේ පොදු ප්‍රවාහනය ඇතුලු විවිධ සේවාවන්ගේ සිදු කෙරුණු සීමා කිරීම් වෛද්‍ය සභා කාර්යාලයේ කටයුතු අඩපන වීමට විශේෂයෙන්ම හේතු විය. දැඩි කාර්ය මණ්ඩල හිඟයක් යටතේ අසීරුවෙන් පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සභා කාර්යාල කාර්ය මණ්ඩලයේ පැමිණීමද සීමා වූ තත්ත්වයක් නිර්මාණය වීම අපේක්ෂිත කාර්ය සාධනයන් කරා ළඟා වීමට උත්සාහ දැරීමට පවා අසීරු තත්ත්වයක් උදා කළේ ය. එනමුත්, වසර අග භාගයේ හෝමියෝපති පාසල් ගොඩනැගිල්ල කාර්යාල ගොඩනැගිල්ලක් දක්වා සංවර්ධනය කිරීම වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දී තිබූ අතර ඔවුන් එම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර තිබුණි.

## 1. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය හා කළමනාකරණය

### 1.1 රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය.

සායන වල කාර්ය සාධනය සම්බන්ධයෙන් ද කොවිඩ් 19 වසංගතය බලපෑවේ පෙර පැවති වර්ධන මට්ටම බිඳ දමන ආකාරයෙනි. මෙහි දී රජය මඟින්ම දිනකට පරීක්ෂා කෙරෙන රෝගීන්ගේ සංඛ්‍යාව සීමා කරන ලදී. අනෙක් අතට ඉතා ම අසීරු තත්ත්වක් යටතේ පමණක් සායන කරා පැමිණෙන ප්‍රවණතාවක් රෝගීන් තුළින්ම නිර්මාණය විය. කෙසේ නමුත් හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලැබූ රජයේ හෝමියෝපති සායන 12 ට අමතරව ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය යටතේ එම ප්‍රදේශයේ රජයේ හෝමියෝපති නව සායනයක් මෙම වසරේ ජූලි මාසයේ දී ආරම්භ කරන ලදී.

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 13 මඟින් මෙම වසර තුල ප්‍රතිකාර ගත් රෝගීන් ප්‍රමාණ පහත පරිදි වේ.

| අනු අංක | සායනය | ප්‍රතිකාර ගත් රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දෙහිවල | 3,630 |
| 2 | තෝලංගමුව | 3,631 |
| 3 | පරකඩුව | 3,745 |
| 4 | කුරුණෑගල | 3,580 |
| 5 | කොත්මලේ | 3,419 |
| 6 | මොණරාගල | 3,618 |
| 7 | පාලමුණෙ | 5,159 |
| 8 | පුත්තලම | 1,984 |
| 9 | මාතලේ | 4,268 |
| 10 | අම්බලන්තොට | 1,755 |
| 11 | මඩකලපුව | 3,320 |
| 12 | ඉංගිරිය | 1,931 |
| 13 | ගාල්ල | 3,575 |
| | එකතුව | 43,615 |

## 1.2 රජයේ හෝමියෝපති සායන කළමනාකරණය.

රජයේ හෝමියෝපති සායන කළමනාකරණය කරනු ලබන්නේ හෝමියෝපති වෛද්‍ය සභාව විසිනි. ඒ අනුව 2021 වසර පුරා ද ඒ වෙනුවෙන් ක්‍රියා කරන ලදී. ඒ යටතේ සේවක වැටුප් හා දීමනා ලබා දීම, ආයතන වල කාර්ය මණ්ඩල පරිපාලනය, සායන වලට ජලය, විදුලිය හා සනීපාරක්ෂක සේවා සැපයීම, සායන උපකරණ , බෙහෙත් හා කාර්යාල උපකරණ ලබා දීම පමණක් නොව ගොඩනැගිලි නඩත්තුව සඳහා ද ක්‍රියා කරනු ලැබේ.

පෙර වර්ෂයේ සායන සඳහා ඉල්ලා තිබූ බෙහෙත් තොග ලැබී තිබුණු අතර ඖෂධ බහාලුම් ලබා දීමට ඇනවුම් කර තිබූ නමුත් ඒවා ලැබීම විවිධ හේතු මත කල් යාමත්, වර්ෂය පුරා පැවති කොවිඩ් - 19 වසංගතය නිසා ඖෂධ බෙදා හැරීමට නොහැකි වීමත් මත සායන වල වෛද්‍ය කටයුතු මඳ පසුබෑමකට ලක් වීමට හේතු විය.

## 02. හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් සංවිධානය කෙරෙන හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම හෝමියෝපති වෛද්‍ය සභාව වාර්ෂිකව සිදු කරන ප්‍රධාන කාර්යයක් වේ.

එහෙත් මෙම වසර ද ආරම්භයේ පටන් ලාංකීය සමාජයට මුහුණ දෙන්නට සිදු වූ කොවිඩ් - 19 වසංගතය නිසා ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා මහජනයා රැස් කර ජංගම සායන පැවැත්වීම සෞඛ්‍යාරක්ෂිතව සිදු කිරීම අසීරු තත්ත්වයකට පත් විය. එහෙයින් මෙම වසරේදී ජංගම සායන හා සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කෙරුණේ ඉතාමත් අල්ප වශයෙන් බව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. මේ අනුව 2021 මාර්තු 08 කාන්තා දිනයට සමගාමීව විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය කළ ඉල්ලීමක් මත පහත සඳහන් වැඩසටහන් රජයේ හෝමියෝපති සායන විසින් මෙහෙය වන ලදී. තව ද එක් ජංගම සායනයක් හෝමියෝපති වෛද්‍ය සභාව අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

| මෙහෙය වීම | ස්ථානය | වැඩසටහන |
|---|---|---|
| 1. තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය | සායන පරිශ්‍රය - 2021.02.06 | සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන |
| 2. මාතලේ රජයේ හෝමියෝපති සායනය | සායන පරිශ්‍රය - 2021.02.10 | සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන හා රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා දීම. |
| 3. ඉංගිරිය රජයේ හෝමියෝපති සායනය | සායන පරිශ්‍රය - 2021.02.11 | සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන, රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා දීම, ප්‍රාදේශීය ලේකම් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම හා පැළ රෝපණය කිරීම. |
| 4. කුරුණෑගල රජයේ හෝමියෝපති සායනය | සායන පරිශ්‍රය - 2021.02.05 | සායනය තුළ හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහන, රෝගීන් දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදා දීම හා දැනුවත් කිරීම, එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා එක්ව ඔසු පැළ රෝපණය කිරීම හා තෝරා ගත් පවුල් කීපයක් වෙත ඔසු පැළ බෙදා දීම. |

| | | |
|---|---|---|
| <u>ජංගම සායනය</u><br><br>හෝමියෝපති වෛද්‍ය සභාව විසින් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත් වන ලදී. | ගණේමුල්ල සිරිමහින්දාරාමය -2021.12.24 | ගරු දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලේ දන් දීමේ වැඩසටහනක් හා ඊට සමාගාමීව හෝමියෝපති සායනයක් පැවැත්වීය. මෙයට රෝගීන් 49 දෙනෙකු පමණ සහභාගී වූ අතර හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමක්ද සිදු විය. |

## 03. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හඳුන්වා දීම හා ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය වැඩසටහන්.

### I. <u>පුවත් පත් ලිපි</u>

#### 01. ඉසිවර පුවත්පත

- ජනවාරි කලාපය - දියවැඩියාව මට්ටු කරන හෝමියෝපති ප්‍රතිකාර
- පෙබරවාරි කලාපය - පීඩාකාරී අර්ශස් රෝගයට තිත තබමු.
- මාර්තු කලාපය - පීනසය සම්පූර්ණ සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- අප්‍රේල් කලාපය - ශල්‍යකර්මයකින් තොරව අර්ශස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- මැයි කලාපය - නහර ගැට ගැසීම සුව කරන විශ්මිත වූ හෝමියෝපති ප්‍රතිකාර (දෙහිවල රජයේ හෝමියෝපති සායනය.)

#### 02. නවලිය පුවත් පත

- මාර්තු - නහර ගැට ගැසීම සුව කරන විශ්මිත වූ හෝමියෝපති ප්‍රතිකාර
- ජූලි - හෙපටයිටිස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර

## 03. දිවයින (සඳුදා) පුවත් පත

2021.01.11 - හර්නියාවට හෝමියෝපති ප්‍රතිකාර

2021.02.15 - පීනසය සම්පූර්ණ සුවයට හෝමියෝපති ප්‍රතිකාර

2021.03.15 - පුරස්ථි ග්‍රන්ථි රෝගයෙන් පීඩා විඳින පුරුෂයින්ට හෝමියෝපති ප්‍රතිකාර

2021.04.05 - ශල්‍යකර්මයකින් තොරව අර්ශස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර

2021.05.10 - පීඩාකාරී හිසරදයට තිත තබමු.

2021.06.28- පොතුකබර රෝගයට නිවැරදි විසඳුම්

## 04. වෛද්‍යවරයා මාසික සඟරාව

- ජනවාරි කලාපය - අත් හා පාද වල ඇති වන හිරිය හෝමියෝපති ක්‍රමයෙන් සුවකර ගනිමු.
- පෙබරවාරි කලාපය - පීනස රෝගයට තිත තබන හෝමියෝපති ප්‍රතිකාර
- මාර්තු කලාපය - පුරුෂයින්ට පීඩා දෙන පුරස්ථි ග්‍රන්ථි ආශ්‍රිත රෝග සුව කරන ප්‍රතිකාර
- මැයි කලාපය - වයස් ගත වන විට කාන්තාවන්ට පීඩා ඇති කරන රෝග
- ජූනි කලාපය - උරහිස් වේදනාවට නොවරදින හෝමියෝපති ප්‍රතිකාර
- ජූලි කලාපය - ඔබ මානසික ආතතියෙන් පීඩා විඳින්නෙක්ද ?

(දෙහිවල රජයේ හෝමියෝපති සායනය.)

## 05. සිරිකත පුවත් පත

- ජනවාරි කලාපය - පීඩාකාරී අර්ශස් රෝගයට සම්පූර්ණ සුවය ගෙන දෙන හෝමියෝපති ප්‍රතිකාර
- පෙබරවාරි කලාපය - පුරුෂයින්ට මූත්‍රා පිට කිරීමට බාධා කරන පුරස්ථි ග්‍රන්ථි ආශ්‍රිත රෝග සුවය

- මාර්තු කලාපය - යටිපතුල් වේදනා සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- අප්‍රේල් කලාපය - ඔබටත් හර්නියාද? හෝමියෝපති ප්‍රතිකාර තුළින් සුවය අත්දකින්න.
- ජූනි කලාපය - කාන්තාවන් හට පීඩා ගෙන දෙන රෝග රැසක් සඳහා හෝමියෝපති
- ජූලි කලාපය - මානසික ආතතියෙන් ගෙන දෙන සංකූලතා වලට නිවැරදි විසඳුම හෝමියෝපති

(දෙහිවල රජයේ හෝමියෝපති සායනය.)

## II. රූපවාහිනී වැඩසටහන්.

01. ස්වර්ණවාහිනී - ආයුබෝවන් ශ්‍රී ලංකා වැඩසටහන

- 2021.01.20 - සයටිකා රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2021.02.10 - පුරුෂයින්ට පීඩා දෙන පුරස්ථි ග්‍රන්ථි රෝගය  පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

(සංවිධානය හා මෙහෙයවීම : දෙහිවල රජයේ හෝමියෝපති සායනය.)

02. සියත ටීවී - පියුම් විල සජීවී විකාශනය

2021.02.26 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2021.03.25 - අධික ලෙස කොන්දේ වේදනාව පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2021.04.01 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2021.04.08 -බෙල්ලේ වේදනාව සහ අත් පා හිරිය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2021.04.22 - ආතරයිටීස් ස්ථිරවම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර

2021.04.29 - නහර ගැට ගැසීම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර

2021.05.06 - අධික හිසරදය වෙනත් භයානක රෝගයක පෙර නිමිත්තක්ද?

2021.05.13 - අර්ශස් රෝගයට ඇති හෝමියෝපති ප්‍රතිකාර

2021.05.20 - පොතු කබර රෝගය නිට්ටාවට සුව කල හැකි හෝමියෝපති ප්‍රතිකාර

2021.06.03 - ගල් තැලුම්, යටි පතුල් පැලීම් වැනි දෑ ඔබටත් තිබේද?

2021.06.10 - ගැස්ට්‍රයිටීස් සුව කර ගනිමු.

2021.06.17 - මානසික ආතතිය.

## 04. වෛද්‍ය නිලධාරීන් නව සායන සඳහා අනුයුක්ත කිරීම.

නව සායන හා වෛද්‍ය සභාව සඳහා පුරප්පාඩුව පවතින වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා 2021.07.12 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එමඟින් තෝරාගෙන සිටි හෝමියෝපති උපාධිධාරීන් වෛද්‍යවරුන් 3න් දෙනෙකු වෛද්‍ය නිලධාරී තනතුර සඳහා මෙම වසරේ දී බඳවා ගන්නා ලදී. එමෙන්ම දෙහිවල සායනයේ කාර්යභාර නිලධාරී හා එම සායනය වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබූ වෛද්‍ය නිලධාරීනිය සේවයෙන් ඉවත් වීම නිසා තෝරාගනු ලැබ සිටි  වෛද්‍යවරු තිදෙනාගෙන් කෙනෙකු දෙහිවල සායනය වෙත ද, නව ගාල්ල සායනය වෙත ද, හා එක් වෛද්‍ය නිලධාරියෙක් සභා කාර්යාලය වෙත ද අනුයුක්ත කරනු ලැබීය.

මෙම පත්වීම ලබා දීමත් සමඟ හෝමියෝපති වෛද්‍ය සභා කාර්ය මණ්ඩලයේ තනතුරු ලාභීන්ගේ සංඛ්‍යාව තිදෙනෙකුගෙන් වර්ධනය වූ අතරම 2016 අංක 10 දරණ නව හෝමියෝපති පණතේ 18 (1) (අ) වගන්තියට අනුව සභාවේ සිටි ලේඛකාධිකාරී වරයාගේ ධූර කාලය 2021.11.04 දින අවසන් වන බව 2021.10.29 දින පැවති එකළොස් වන වෛද්‍ය සභා රැස්වීමේ දී තීරණය කරන ලද අතර එම තීරණයට අනුව ලේඛකාධිකාරී වරයාගේ ධූර කාලය නිමා විය.

## 05. හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

නව වෛද්‍ය සභාව පත් වී තිබීම නිසා පසුගිය වසර වල මෙන් නොව හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන්  හට ලියාපදිංචිය ලබා දීමේ සභාව මුහුණ දුන් ගැටලු විසඳාලීමට හැකියාව ලැබුණු නමුත් ඔවුන් හට ලියාපදිංචි සහතික පත්‍ර නිකුත් කිරීමට යාමේ දී ඒවා මුද්‍රණයේ දී, අංකනයේ දී හා මෙන්ම සහතික පත්‍ර ලිවීමේ දී ද යම් යම් ගැටළු සහගත තත්ත්වයන් මතු විය.

ඒ අනුව, හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන්  5 දෙනෙකු ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබුණු අතර හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ඔවුන් ලියාපදිංචි කරන ලදී. මේ අනුව මෙරට ලියාපදිංචිය හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 308 දක්වා වර්ධනය විය.

## 06. හෝමියෝපති බෙහෙත් ආනයනය සඳහා නිර්දේශ ලබා දීම.

හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා පහත නම් සඳහන් වෛද්‍යවරුන් සහ ආයතනය වෙත ඩොලර් **63,846.89** ක් සහ ඉන්දියානු රුපියල් **155,092.00** වටිනා ආනයන බලපත්‍ර 17ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 01 | වෛද්‍ය ජේ.ජේ.ජී.කේ. ප්‍රනාන්දු (25/01/2021) | - | $2007.05 | |
| 02 | වෛද්‍ය ජී. හෆීසා බෙගම් (25/01/2021) | - | $5192.07 | |
| 03 | වෛද්‍ය චන්දන වීරසේකර (01/02/2021) | - | | **In.Rs.**155,092.0 |
| 04 | වෛද්‍ය ඩී.බී.එස්.ආර්.කේ.විට්ටහච්චි (02/02/2021) | - | $10,826.27 | |
| 05 | වෛද්‍ය එච්.එස්. ගුණවර්ධන (23/03/2021) | - | $9,144.585 | |
| 06 | වෛද්‍ය ඒ. ශාන්තකුමාර (05/04/2021) | - | $2,454.40 | |
| 07 | වෛද්‍ය එස්.ජී. හරිනි (05/04/2021) | - | $7,264.99 | |
| 08 | වෛද්‍ය එස්.ජී. හරිනි (07/05/2021) | - | $2,046.24 | |
| 09 | වෛද්‍ය එස්.ජී. හරිනි (07/05/2021) | - | $5,566.73 | |
| 10 | වෛද්‍ය ජී. හෆීසා බෙගම් (18/06/2021) | - | $2,873.67 | |
| 11 | වෛද්‍ය ඩී.බී.එස්.ආර්.කේ.විට්ටහච්චි (08/07/2021) | - | $4,436.00 | |
| 12 | වෛද්‍ය එස්.ඩී.පී. පෙරේරා (09/07/2021) | - | $383.83 | |
| 13 | වෛද්‍ය එස්.පී. පතිරගේ (09/07/2021) | - | $820.00 | |
| 14 | වෛද්‍ය ඩබ්.ඩී. නිමල් ලීටස් (09/07/2021) | - | $497.17 | |
| 15 | වෛද්‍ය ඩබ්.ඩී. නිමල් ලීටස් (09/07/2021) | - | $738.215 | |
| 16 | වෛද්‍ය ඩී.බී.එස්.ආර්.කේ.විට්ටහච්චි (17/09/2021) | - | $9,595.68 | |
| | **එකතුව** | **=** | **$ 63,846.89** | **In.Rs. 155,092.0** |

## 07. නව සායන ආරම්භ කිරීම.

2016 වසරේදී අනුමත කරන ගන්නා ලද හෝමියෝපති වෛද්‍ය සභාවේ නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සඳහා නව සායන 02ක් ආරම්භ කිරීමට අවශ්‍යව පැවතුණු අතර මේ සඳහා ගාල්ල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02ක ස්ථාන හඳුනා ගෙන ඒවායෙහි ගොඩනැඟිලි සකස් කිරීමේ කාර්යයන් වෙත ද යොමුව තිබුණි. එහෙත් වෛද්‍ය සභාවක් පත් කෙරී නොතිබුණු තත්ත්වයක් යටතේ මෙම කාර්යයන්ද ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොපැවතුණි. පසුගිය වසර අග නව වෛද්‍ය සභාව පත් වූ බැවින් ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය යටතේ එම ප්‍රදේශයේ සායනයක් 2021.07.13 දින ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. මෙම වසර අවසානය වන විට පොළොන්නරුව සායනය ද ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කෙරෙමින් පැවතුණි.

# 10. වාර්ෂික ගිණුම් වාර්තා

## හෝමියෝපති වෛද්‍ය සභාව

## 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 8 දක්වා )
- 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 9 දක්වා )
- 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 6 දක්වා )
- 2021 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ වාර්තාව
- 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

## ගිණුම් කරන ප්‍රතිපත්ති

### ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක1ට අනුවය.එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහාපෑම" යනපරිදි ඉදිරිපත් කර ඇත.හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්ථන හා මූල ධන වියදම් සඳහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන් සභාවට ලද ප්‍රදානයක් ලෙසත් එසේම එම ප්‍රධානයන්ගෙන් දරනු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

### ක්ෂය සඳහා වෙන්කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගන වේ .

2021 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12 % ක්ෂය අනුපාතයට වේ .

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිති අංක 7 (24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව එනම් සභාවෙ වත්කම් ක්ෂය කරනු ලබනුයේ වත්කම් පාවිච්චි කිරීමට සූදානම් කිරීමෙන් පසුවය.එසේම වත්කම් පෙත්වලින් ඉවත් කළ යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද කටයුතු කරනු ඇත.

### පාරිතෝෂිත සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවාකාලයක් ඇති නිලධාරින් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින් පනතේ සඳහන් පරිදි වසර පහකට වඩා වැඩි සේවාකාලයක් ඇති නිලධාරින් සඳහා පමනක් පාරිතෝෂිත සඳහා වෙන්කරනු ලැබ ඇත.එ් අනුව 2021 වර්ෂයේ එවැනි සුදුසුකම් ලැබූ නිලධාරින් / සේවකයින් 17 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත

**හෝමියෝපති වෛද්‍ය සභාව**

**2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | සටහන් | 2021<br>රු | 2020<br>රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,681,040 | 2,601,730 |
| ඖෂධ බහාලුම් තොග ගිණුම | | 384,731 | 15,801 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| පිරියත උපකරණ | 2 | 4,057,941 | 2,522,474 |
| ගොඩනැගිලි පුනුරුත්තාපනය | | 6,341,215 | 5,407,281 |
| වෙනත් උපකරණ | | 1,450 | 1,450 |
| | | **10,400,606** | **7,931,205** |
| **මුළු වත්කම්** | | **13,466,377** | **10,548,736** |
| **බැරකම්** | | | |
| ජංගම බැරකම | 3 | 2,966,726 | 2,317,234 |
| ජංගම නොවන බැරකම් | | – | – |
| මුළු බැරකම් | | 2,966,726 | 2,317,234 |
| ශුද්ධ වත්කම් | | **10,499,651** | 8,231,502 |
| | | **13,466,377** | **10,548,736** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය | | 2,562,144 | 2,562,144 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන(සංචිත) | | 11,160,321 | 8,388,226 |
| සමුච්චිත ඌනතා / අතිරික්තතා | 4 | (3,192,398) | (2,688,452) |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | | (30,416) | ( 30,416) |
| | | **10,499,651** | **8,231,502** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරි<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සභාපති<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | කමිටු සමාජික<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සකස් කළේ<br>කේ.එස්.පියසිරි<br>විශ්‍රාමික ප්‍රධාන<br>ගණකාධිකාරි<br>දේශිය වෛද්‍ය<br>අමාත්‍යාංශය |

| | 2021<br>රු | 2020<br>රු |
|---|---|---|
| සටහන 01 | | |
| මුදල් හා මුදලට සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 2,022,267 | 1,953,157 |
| ලංකා බැංකුව | 462,873 | 452,673 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900 |
| | **2,681,040** | **2,601,730** |
| සටහන 02 | | |
| පිරියත උපකරණ | | |
| පිරියත උපකරණ( ගත්මිල) | 6,524,203 | 4,686,042 |
| අඩුකලා | | |
| සමුච්චිත ක්ෂය | (2, 466,262 ) | (2,163,568) |
| ශුද්ධ අගය | **4,057,941** | **2,522,474** |
| සටහන 03 | | |
| ගෙවිය යුතු දෑ | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 97,810 | 151,610 |
| ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු | 50,000 | 42,000 |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | 4,171 | 6,835 |
| ගෙවිය යුතු විදුලිය | 2,192 | 5,180 |
| ගෙවිය යුතු ජලය | 14,305 | 14,892 |
| පාරිතෝෂිත වෙන්කිරිම | 2,542,908 | 1,997,328 |
| ගෙවිය යුතු ගමන් වියදම් | 35,725 | 36,805 |
| ගෙවිය යුතු සායන වියදම් | 10,585 | 17,371 |
| ගෙවිය යුතු වරිපනම් | 2,000 | 2,000 |
| ගෙවිය යුතු පරිවර්ථන ගාස්තු | - | 2,963 |
| ගෙවිය යුතු විවිධ වියදම් | - | 40,250 |
| ගෙවිය යුතු දැන්වීම් ගාස්තු | 132,030 | - |
| ගෙවිය යුතු සභාපති දීමනා | 75,000 | - |
| | **2,966,,726** | **2,317,234** |
| සටහන 04 | | |
| සමුච්චත ඌනතා / අතිරික්තතා 2021.01.01 | **(2,688,452)** | **(2,688,452)** |
| එකතුකලා 2021 වර්ෂයේ ගැලපිම් | **(191,365)**<br>**(2,879,817)** | |
| එකතුකලා<br>2021 වර්ෂයේ කාර්ය සාධනයේ ඌනතා / අතිරික්තතා | **(312,581)** | |
| | **(3,192,398)** | **(2,688,452)** |

සටහන 05

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකාරාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 01ට අනුවය.

සටහන 06

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ. 2021 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක ක්ෂය අනුපාතයකට වේ. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිති අංක 7(24) පරිදි වත්කම්හි පිරිවැය මත ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 69 ඡේදය ප්‍රකාරව එනම් සභාවේ වත්කම් ක්‍ෂය කරනු ලබනුයේ වත්කම් පාවිච්චි කිරීමට සූදානම් කිරීමෙන් පසුවය. එසේම වත්කමක් පොත්වලින් ඉවත් කළ යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද නටයුතු කරනු ඇත.

සටහන 07

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව වර්ෂ පහකට වැඩි සේවාකාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ අනුව 2021 වර්ෂය සඳහා එවැනි සුදුසුකම් ලැබූ නිලධාරීන් /සේවකයින් 17 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.

සටහන 08

මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාවට එරෙහිව ගරු අධිකරණයේ නඩු 05 විභාග වෙමින් පවතී.

(i). 7087/11/m අංක දරන , හෝමියෝපති වෛද්‍ය සභාව සහ එහි සාමාජිකයින් 06 දෙනෙකු විත්තිකරුවන් කරමින් වෛද්‍ය නිමල් ගාමිණී විජේතුංග විසින් පවරා ඇති නඩුව, දෙහිවල සායනයේ ගරු සේවයේ යෙදෙමින් කටයුතු කළ ඔහුව සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන තුනක් ඉල්ලා පවරනු ලැබ ඇති මෙම නඩුව ගල්කිස්ස දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ii). 13953/m අංක දරණ හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතුව සිටි (ස්ථිර පදනමින් නොවන)M.R.D සේරම් යන අය සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන දෙකක වන්දියක් ඉල්ලා මීගමුව දිසා අධිකරණයේ මෙම නඩුව පවරා ඇත.මෙය තවදුරටත් විභාග වෙමින් පවතී.

(ii). 13953/m අංක දරණ හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතුව සිටි (ස්ථිර පදනමින් නොවන)M.R.D සේරම් යන අය සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන දෙකක වන්දියක් ඉල්ලා මීගමුව දිසා අධිකරණයේ මෙම නඩුව පවරා ඇත.මෙය තවදුරටත් විභාග වෙමින් පවතී.

(iii). 51/52/2010 අංක දරණ වත්තල කම්කරු විනිශ්චය සභාවේ පනවා ඇති නඩුව , 13953/mඅංක දරණ නඩුවේ පැමිණිලිකරු විසින්ම එම නඩු නිමිත්ත මතම මෙම නඩුවද පවරා ඇත. මෙය තව දුරටත් විභාග වෙමින් පවතී.

(iv). 14318-m මීගමු දිසා අධිකරණය

2009 වසරේ එතෙක් පැවැති වෛද්‍ය විසුරුවා හැරීමෙන් පසුව පත් කෙරෙනු ලේඛණාධිකාරී සහ සිදු කෙරෙනු ලියා පදිංචි කිරීමේ බල රහිත කරන ලෙස ඉල්ලා මෙම නඩුව පවරා ඇත්තේ වෛද්‍ය S.D.Pපෙරේරා මයා විසිනි. මෙයද අවසන් වී නොමැත.

(v) හෝමියෝපති අතුරුපාලක කමිටුවට වෛද්‍ය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා පැවරූ නඩුවේ තීන්දුව ගරු අභියාචනාධිකරණය විසින් ලබා දුනි. එමගින් හෝමියෝපති අතුරු පාලක කමිටුව පත් කිරීම කැබිනට් අනුමැතියේ නියමයන්ට අනුකූලව සිදුකර නොමැති බව දක්වමින් ගරු අභියාචනාධිකරණය හෝමියෝපති අතුරුපාලක කමිටුවේ සියලු තීරණ අවලංගු කිරීමට නියෝග කරන ලදි.

මෙම නඩුවේ තීන්දුවට අදාළ ලියකියවිලි වල ඇතුලත් සියලු කරුණු සැළකිල්ලට නොගැනීම මත ලබා ඇති එකක් බවට දක්වමින් එයට එරෙහි තීන්දුවක් ඉල්ලා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත මෙම අභියාචනය විභාගයට ගැනීමට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. නඩු අංකය Sc/FR/A/390/2021 ශ්‍රේෂ්ඨාධිකරණය

# හෝමියෝ වෛද්‍ය සභාව
# 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන් | 2021<br>රු | 2020<br>රු |
|---|---|---|---|
| අයභාරය | | | |
| රජයේ පුණරාවර්තන ප්‍රතිපාදන | | 24,429,201 | 22,482,797 |
| වෙනත් අයභාර | 1 | 10,200 | 11,200 |
| බැංකු පොලී | | 69,460 | 79,018 |
| මුළු අයභාරය | | **24,508,861** | **22,573,015** |
| වියදම | | | |
| වැටුප් වේතන හා සේවක පතිලාභ | 2 | 21,196,793 | 21,410,642 |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 3 | 57,413 | 405,125 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | | 30,2694 | 234,806 |
| වෙනත් වියදම් | 4 | 3,264,192 | 2,241,471 |
| මූල්‍ය පිරිවැය( බැංකු ගාස්තු) | | 350 | 350 |
| මුළු වියදම | | **24,821,442** | **24,292,394** |
| කාලච්ඡේදය සඳහා ඌනතාවය/අතිරික්තය | | ( 312,581) | (1,719,379) |
| | | ( 312,581) | (1,719,379) |

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරි<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සභාපති<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | කමිටු සමාජික<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සකස් කළේ<br>කේ.එස්.පියසිරි<br>විශ්‍රාමික ප්‍රධාන<br>ගණකාධිකාරි<br>දේශිය වෛද්‍ය<br>අමාත්‍යාංශය |

| | 2021<br>රු | 2020<br>රු |
|---|---|---|
| සටහන **01** | | |
| වෙනත් අයභාර | | |
| වාර්ෂික ගාස්තු | 5,200 | 7,200 |
| විවිධ ලැබීම් | 5,000 | 4,000 |
| | **10,200** | **11,200** |
| සටහන **02** | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 18, 424,041 | 18,591, 492 |
| සේවක අර්ථසාධක අරමුදල් | 2,218,202 | 2,229, 416 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 554,550 | 557,355 |
| අතිකාල වියදම් | - | 32,379 |
| | **21,196,793** | **21,410,642** |
| සටහන **03** | | |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 19,739 | 3,318 |
| සංග්‍රහ වියදම් | 35,748 | 8,957 |
| ඖෂධ බහාලුම් හා ඖෂධ බහාලුම් කවර පරිභෝජනය | 1,926 | 392,850 |
| | **57,413** | **405,125** |
| සටහන **04** | | |
| වෙනත් වියදම් | | |
| ගණකාධිකාරි ගාස්තු | 50,000 | 42,000 |
| විගණන ගාස්තු | 95,000 | 50,000 |
| දුරකථන ගාස්තු | 52, 487 | 45,654 |
| වෛද්‍ය සායන වියදම් | 73,615 | 48, 474 |
| විදුලි ගාස්තු | 87, 413 | 103, 419 |
| ජල ගාස්තු | 78, 442 | 48,178 |
| ගමන්වියදම් | 19,920 | 18,064 |
| තැපැල් වියදම් | 10,780 | 6,215 |
| මුද්‍රණ වියදම් | 281,000 | 173,575 |
| විවිධ වියදම් | 8,675 | 46,616 |
| භාෂා පරිවර්තන ගාස්තු | 38,530 | 5,598 |
| සභාපති දීමනා | 900,000 | 260,000 |
| වෛද්‍ය සභා රැස්වීම් දිමනා | 342,000 | 132,000 |
| පාරිතෝෂිත වියදම් | 468,375 | 1,156,678 |
| නීති ගාස්තු | 105,000 | 105,000 |
| අලුත්වැඩියා වියදම් | 37,345 | - |
| ගෙවල් කුලි | 24,000 | - |
| සනීපාරක්ෂක වියදම් | 193, 430 | |

| | | |
|---|---|---|
| ඉන්ධන වියදම | 19,136 | - |
| දැන්වීම් ගාස්තු | 369,684 | - |
| ප්‍රවාහන වියදම | 9,360 | |
| | **3,264,192** | **2,241,471** |

සටහන අංක **05**

**ගිණුම් ඉදිරිපත් කිරිම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති (2009) අංක 1 ට අනුවය ·එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගිකරණය විදහාපැම" යන පරිදි ඉදිරිපත් කර ඇත·

සටහන අංක **06**

2021 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කර ඇත ·

සටහන අංක **07**

**පාරිතෝෂිත සඳහා වෙන්කිරිම·**

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවිමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවාකාලයක් ඇති නිලධාරින් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින් පනතේ සඳහන් පරිදි වසර පහකට වඩා වැඩි සේවාකාලයක් ඇති නිලධාරින් සඳහා පමනක් පාරිතෝෂිත සඳහා වෙන්කරනු ලැබ ඇත.එ අනුව 2021 වර්ෂයේ එවැනි සුදුසුකම් ලැබූ නිලධාරින් / සේවකයින් 17 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත

සටහන **08**

හොමියෝපති වෛද්‍ය සභාවෙ පුනරාවර්ථන හා මුලධන වියදම් සඳහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන් සභාවට ලැබුණු ප්‍රතිපාදනයන් ලෙසත් එසේම එම ප්‍රතිපාදනයන් ගෙන් දරණු ලැබු වියදම් සභාවේ වියදම් ලෙසත් සළකා අවසන් ගිණුම පිළියෙල කර ඇත.

සටහන **09**

වරිපනම් සඳහා 2020 හා 2021 වර්ෂවලට අදාලව බැරකම් ඉදිරිපත් වී නොවුනු නිසා

2021 වර්ෂය සඳහා වරිපනම් වෙනුවෙන් මුදලක් වෙන් නොකරන ලදී.

# හෝමියෝපති වෛද්‍ය සභාව
# 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# ඒකාබද්ධ මුදල් ප්‍රවාහා ප්‍රකාශනය

| | සටහන් | 2021 රු | 2020 රු |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් | | | |
| රජයෙන් ලද පුනරාවර්ථන ප්‍රදානය | | 24,429,201 | 22,482,797 |
| බැංකු පොලි | | 69,460 | 79,018 |
| වෙනත් ලැබීම් | 1 | 10,200 | 11,200 |
| | | **24,508,861** | **22,573,015** |
| ගෙවීම් | | | |
| සේවක පිරිවැය | 2 | 21,300,344 | 21,419,143 |
| බැංකු පොලි | | 350 | 350 |
| වෙනත් ගෙවීම් | 3 | 3,128,857 | 1,063,654 |
| | | **24,429,551** | **22,483,147** |
| මෙහෙයුම් ක්‍රයාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | **79,310** | **89,868** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 2,772,095 | 885,892 |
| දේපල පිරියත හා උපකරණ | | (1,838,161) | (885,892) |
| ගොඩනැගිලි පුනුරුත්තාපන සඳහා | | (933,934) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | - | |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 4 | 79,310 | 89,868 |
| කාලාච්ඡේදය ආරම්භයේදි වූ | 5 | 2,601,730 | 2,511,862 |
| මුදල් හා මුදල් සමාන දෑ | | | |
| කාලච්ඡේදය අවසානයේදි වූ මුදල් හා මුදල් සමාන දෑ | 6 | 2,681,040 | 2,601,730 |

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරි<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සභාපති<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | කමිටු සමාජික<br>හෝමියෝපති<br>වෛද්‍ය සභාව | සකස් කළේ<br>කේ.එස්.පියසිරි<br>විශ්‍රාමික ප්‍රධාන<br>ගණකාධිකාරි<br>දේශිය වෛද්‍ය<br>අමාත්‍යාංශය |

| | 2021<br>රු | 2020<br>රු |
|---|---|---|
| සටහන 01 වෙනත් ලැබීම් | | |
| වාර්ෂික ගාස්තුව | 5,200 | 7,200 |
| විවිධ ආදායම් | 5,000 | 4,000 |
| | **10,200** | **11,200** |
| සටහන 02 සේවක පිරිවැය | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 18,506,881 | 18,599,992 |
| සේවක අර්ථසාධක අරමුදල් | 2,236,211 | 2,229,417 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 557,252 | 557,355 |
| අතිකාල | - | 32,379 |
| | **21,300,344** | **21,419,143** |
| සටහන 03 අනෙකුත් ගෙවීම් | | |
| විගණන ගාස්තු | 148,800 | 77,400 |
| දූරකථන ගාස්තු | 55,150 | 42,814 |
| විවිධ වියදම් | 48,925 | 6,366 |
| විදුලි ගාස්තු | 91,456 | 103,625 |
| ජල වියදම් | 79,029 | 53,579 |
| ගමන් වියදම් | 21,000 | 9,950 |
| තැපැල් ගාස්තු | 10,780 | 6,215 |
| මුද්‍රණ ගාස්තු | 281,000 | 173,575 |
| ලිපි ද්‍රව්‍ය | 19,739 | 3,318 |
| සංග්‍රහ වියදම් | 35,748 | 8,957 |
| පරිවර්තන ගාස්තු | 41,493 | 2,635 |
| සභාපති දීමනා | 825,000 | 260,000 |
| වෛද්‍ය සභා නිලධාරි රැස්වීම් දිමානා | 342,000 | 132,000 |
| අළුත්වැඩියා | 37,345 | - |
| නීති ගාස්තු | 105,000 | 105,000 |
| ඖෂධ හගාලම් මිලට ගැනීම | 255,336 | - |
| ඖෂධ කවර මිලට ගැනීම | 115,520 | - |
| සායන වියදම් | 81,956 | 36,220 |
| ගණකාධිකාරි ගාස්තු | 50,000 | 42,000 |
| ගෙවල් කුලි | 24,000 | - |
| සනිපාරක්ෂක වියදම් | 193,430 | - |
| ඉන්ධන | 19,136 | - |
| දැන්වීම් ගාස්තු | 237,654 | - |
| ප්‍රවාහන වියදම් | 9,360 | |
| | **3,128,857** | **1,063,654** |

| | | |
|---|---:|---:|
| සටහන 04 | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | |
| වර්ෂ අවසාන මුදල් ශේෂය | 2,681,040 | 2,601,730 |
| වර්ෂ ආරම්භක මුදල් ශේෂය | 2,601,730 | 2,511,862 |
| | **79,310** | **89,868** |
| සටහන 05 | | |
| කාලච්ඡේදයට ආරම්භයට වූ මුදල් හා මුදල් සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,953,157 | 1,874,489 |
| ලංකා බැංකුව | 452,673 | 441,473 |
| ලංකා බැංකුව (රාජගිරිය) | 195,900 | 195,900 |
| | **2,601,730** | **2,511,862** |
| සටහන 06 | | |
| කාලච්ඡේදයට අවසානයට වූ මුදල් හා මුදල් සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 2,022,267 | 1,953,157 |
| ලංකා බැංකුව | 462,873 | 452,673 |
| ලංකා බැංකුව (රාජගිරිය) | 195,900 | 195,900 |
| | **2,681,040** | **2,601,730** |
| | **79,310** | **89,868** |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්තයේ / ඌණතාවය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමග සැසඳීම | | |
| සමුච්චිත ඌණතා අතිරික්තතා ගිණුමට 2021 වර්ෂයේ දි කරන ලද ශුද්ධ ගැලපීම් | (191,365) | - |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්තය / ඌණතාවය | (312,581) | (1,719,379) |
| තොගයේ වෙනස්වීම - තෝගයේ වැඩිවීම | (368,930) | 392,850 |
| මුදල් නොවන වෙනස්වීම | | |
| ක්ෂය වීම | 302,694 | 234,806 |
| ගෙවිය යුතු වැය වැඩි විම් | 649,492 | 1,181,591 |
| | **79,310** | **89,868** |

# හෝමියෝපති වෛද්‍ය සභාව

| ස්කන්ධය වෙනස්වීම (සංචිත) 2021 | රු |
|---|---|
| 2021.01.01 දිනට ශේෂය ප්‍රාග්ධන ගිණුම | 2,562,144 |
| 2021.01.01 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන ගිණුමේ ශේෂය | 8,388,226 |
| 2021 වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 2,772,095 |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | (30,416) |
| සමුච්චිත ඌණතාවය/අතිරික්තය | (3,192,398) |
| **2021.12.31 දිනට ශේෂය** | **10,499,651** |

# 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | හර | බැර |
|---|---|---|
| බැංකුව (කොමර්ෂල්) | 2,022,267 | |
| ලංකා බැංකුව | 462,873 | |
| ලංකා බැංකුව (රාජගිරිය) | 195,900 | |
| වෙනත් උපකරණ | 1, 450 | |
| පිරියත උපකරණ | 6,524,203 | |
| ක්ෂය වෙන් කිරීම | | 2, 466,262 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | , 97,810 |
| ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු | | 50,000 |
| ගෙවිය යුතු දූරකථන ගාස්තු | | 4,171 |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | | 2,192 |
| ගෙවිය යුතු ජල ගාස්තු | | 14,305 |
| ගෙවිය යුතු පාරිතෝෂිත දීමනා | | 2,542,908 |
| ප්‍රාග්ධනය | | 2,562,144 |
| රජයේ මූලධන ප්‍රතිපාදන (සංචිත) | | 11,160,321 |
| සමුච්චිත ඌණතා අතිරික්තතා ගිණුම | 2,879,817 | |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | 30, 416 | |
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | | 24, 429,201 |
| වැටුප් හා වේතන | 15,209,311 | |
| ගෙවිය යුතු ගමන් වියදම් | | 35,725 |
| අර්ථසාධක අරමුදල් | 2,218,202 | |
| සේවා නියුක්ති භාර අරමුදල් | 554,550 | |
| දුරකථන වියදම් | 52, 487 | |
| විදුලි වියදම් | 87, 413 | |
| ජල වියදම් | 78, 442 | |
| සායන වියදම් | 73,615 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 19,739 | |
| ගමන් වියදම් හා නවාතැන් ගාස්තු | 19,920 | |
| සංග්‍රහ වියදම් | 35,748 | |
| විවිධ වියදම් | 8,675 | |
| තැපැල් වියදම් | 10,780 | |
| මුද්‍රණ ගාස්තු | 281,000 | |
| නීති ගාස්තු | 105,000 | |
| පරිවර්තන ගාස්තු | 38,530 | |
| ගෙවිය යුතු සායනික වියදම් | | 10,585 |
| ලැබූ බැංකු පොලී | | 69, 460 |
| වාර්ෂික ගාස්තු | | 5,200 |
| විවිධ ආදායම් | | 5,000 |
| වාර්ෂික ක්ෂය | 302,694 | |

| | | |
|---|---|---|
| විගණන ගාස්තු | 95,000 | |
| ගණකාධිකාරි ගාස්තු | 50,000 | |
| බැංකු ගාස්තු | 350 | |
| ගෙවිය යුතු වරිපනම් | | 2,000 |
| ඖෂධ බහාලුම් හා කවර වියදම් | 1,926 | |
| ගෙඩනැගිලි පුනුරුත්තාපන හා වැඩි දියුනු කිරිම | 6,341,215 | |
| පාරිතෝෂිත දීමනා | 468,375 | |
| සභාපති දිමනා | 900,000 | |
| වෛද්‍ය සභා රැස්වීම් දීමනා | 342,000 | |
| ඖෂධ බහාලුම් හා කවර තෝග ගිණුම | 384,731 | |
| අලුත්වැඩියා වියදම් | 37,345 | |
| ගෙවිය යුතු සභාපති දිමනා | | 75,000 |
| ගෙවල් කුලී | 24,000 | |
| සනීපාරක්ෂක වියදම් | 193, 430 | |
| ඉන්ධන වියදම් | 19,136 | |
| දැන්වීම් ගාස්තු | 369,684 | |
| ප්‍රවාහන වියදම් | 9,360 | |
| ජීවන වියදම් හා වෙනත් වියදම් | 3,214,730 | |
| ගෙවිය යුතු දැන්වීම් ගාස්තු | | 132,030 |
| | **43,664,314** | **43,664,314** |

# 11. විගණන වාර්තාව

2016 අංක 10 දරණ හෝමියෝපති පනත අනුව 2020 සැප්තැම්බර් 09 වන දින නව වෛද්‍ය සභාව පත්වන ලදී. නව වෛද්‍ය සභාව යටතේ හෝමියෝපති ක්ෂේත්‍රයේ දියුණුවට සහ ජනතාවගේ සෞඛ්‍ය නංවාලීමට සහ පෙර විගණනය මගින් පෙන්වා දී තිබූ ගැටළු විසඳාලීම සඳහා ද සුවිශේෂී තීරණ රැසක් සිදු කරන ලද අතර ඒවා ක්‍රියාත්මක කරමින් හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය නගා සිටුවීම ද සිදු කරන ලදී. රටෙහි පැවැති කොරෝනා වසංගතය හමුවේ පැමිණි සියළුම බාධක මැඩ ගනිමින් සියළුම පරිපාලන කටයුතු සාර්ථකව සිදු කිරීමට හැකිවිය. එමෙන්ම, වසංගත රෝග තත්ත්වය පාලනයට සහ පසු කොවිඩ් සංකූලතා මැඩ පැවැත්වීමට ද හෝමියෝපති ඖෂධ භාවිතයෙන් මහඟු සේවයක් සිදු කිරීමද අප ආයතනය සිදුකල සුවිශේෂී කාර්යය භාරයක්වේ. තව ද වෛද්‍ය සභාවට අනුමත ගිණුම් අංශයක් නොතිබෙන බැවින් සහ වෛද්‍ය සභාවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෙම වසරේදී ද සභාවේ ගිණුම් කටයුතු සිදුකරනු ලැබුවේ දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය මගිනි. කෙසේ වෙතත් වෛද්‍ය සභාවක් නොමැති කාලයේ අතපසු වී තිබූ බොහෝ කාර්යයන් සහ කාර්යාලීය වැඩ කටයුතු මග හරවා ගැනීම සඳහා අභිනවයෙන් පත් වූ වෛද්‍ය සභාව කඩිනමින් සහ සාර්ථකව ක්‍රියා කළ බව සඳහන් කළ යුතුය. මෙම වසරට අදාළව සකස් කෙරුණු සභා සම්මත වූ අවසන් ගිණුම් වාර්තා, මේ සමඟ ඉදිරිපත් කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනයේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාව මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

වෛද්‍ය ඩී. එම්. අෂාන් තිලංක
සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ඊඑච්ඕ/ඒ/එච්එම්සී/එෆ්ඒ/2021/03

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2022 දෙසැම්බර් 12 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව

**හෝමියෝපති වෛද්‍ය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන වෛද්‍ය සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

වෛද්‍ය සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා වෛද්‍ය සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට වෛද්‍ය සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාහාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 5(1) ඡේදය | නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමේ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂිකය ගෙවිය යුතු වුවද, 2021 ජූලි 15 දින සේවයෙන් ඉවත්ව තිබුණු වෛද්‍ය නිලධාරියෙකු වෙත පාරිතෝෂිත ගෙවා නොතිබුණු අතර 2021 නොවැම්බර් 09 දින සේවයෙන් ඉවත්ව තිබුණු ලේඛකාධිකාරී වෙත නියමිත කාලසීමාව තුළ පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් රු.52,140 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. |

(ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනත

----------------------------------

| | |
|---|---|
| (i) 15 වගන්තියේ (ඇ) හා (ඉ) උප වගන්ති | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් හෝමියෝපති ආයතනයක් පිහිටුවා නොතිබුණු අතර රජයේ හොමියෝපති ශික්ෂණ රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සඳහා අවම ප්‍රමිතීන්, රීති හා රෙගුලාසි පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණු හෙයින් එම ආයතන නියාමනය කිරීමේ කාර්යය ඉටුවී නොතිබුණි. |
| (ii) 28 (6) උප වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තු හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (iii) 30 වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්විය යුතු වුවද, විභාගය පැවැත්වීම සඳහා වූ නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු විභාගය, 2022 ඔක්තෝබර් 31 දින වන විටත් පැවැත්වීමට නොහැකිවීමෙන් වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ප්‍රමාදවී තිබුණි. |
| (iv) 31 උප වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, 2022 ඔක්තෝබර් 31 දින වන විටත් එම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

---------------------------------------

| | |
|---|---|
| (i) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය | සේවයෙහි ස්ථිරකිරීම, උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම ආදී විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවද, 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බඳවා ගෙන තිබුණු තනතුරු 04 කට අදාළව නිලධාරීන් 32 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වූ 2022 ඔක්තෝබර් 31 දින වන විටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| (ii) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.3 වගන්තිය | සාමාන්‍යයෙන් නිවාඩු ඉල්ලුම් පත්‍රයක් නිවාඩුව ආරම්භ වන දිනට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් නිවාඩු අනුමත කරන බලධරයාගේ කාර්යාලයට ලැබිය යුතු වුවද, වෛද්‍ය සභා කාර්යාලයේ නිලධාරීන් නිවාඩු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර අනුමත කරවාගෙන නොතිබුණි. |
| (iii) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | 190 වැනි පොදු ආකෘති ප්‍රකාරව නිවාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (iv) ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අවසර ලබා නොගෙන ස්වකීය කාර්ය ස්ථානයෙන් පිට යාමට නිලධාරියකුට නොහැකි වුවද, වෛද්‍ය සභාවේ නිලධාරීන් අනුමැතිකින් තොරව පිටවී තිබුණු අතර බැහැරයාමේ ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 133 | සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 751 | ආයතනයට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛණ පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, 2020 වර්ෂයේදී මිලදීගත් රු.255,140 ක් වූ භාණ්ඩ පොදු ද්‍රව්‍ය හා ශලා ද්‍රව්‍ය ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. |
| (ඉ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවද, 2009 වර්ෂයේදී අයකර තිබුණු රු.1,204,500 ක්වූ පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.2,022,267 ක් විය. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2021 මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම් මාස 07 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2022 ඔක්තෝබර් 04 දින ඉදිරිපත් කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතකර නොමැති බව.

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) මහජන මුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියකින් තොරව "හෝමියෝපති අරමුදල" නමින්, එකක් රු.5,000 ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණි. මුද්‍රණය කළ වර්ෂය, මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 159 ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.795,000 ක් විය. ඉන් පොත් 416 ක තොගයක් ඉතිරිව පැවතුණු අතර 2022 ඔක්තෝබර් 31 දින වනවිටත් එම ආධාර පත්‍ර පොත් අවලංගු කිරීමට හෝ අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු.1,199,254 ක ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම් වර්ෂ 13 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුන අතර ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයෙන් බැහැරව හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා භාවිතා කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# සුභාශිංසන

★ ★ ★ ★

ගරු දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ

ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා

ලේකම් සහ අතිරේක ලේකම්වරියන්

හෝමියෝපති වෛද්‍ය සභාවේ සභාපති ඇතුළු

සාමාජිකයන් / සාමාජිකාවන්

නීතිමය දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය